**ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - 2015**

**-----------------------------------------------------**

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

2001 වර්ෂයෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණු බැවින් එම වත්කම් සාධාරණ අගයට ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයන්ට අදාළව විශ්‍රාම පාරිතෝෂික අරමුදල් නිවැරදිව ගණනය කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිකය රු.134,944 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2007 හා 2009 වර්ෂවල පවත්වා තිබුණු ඵලදායීතා තරඟාවලිය සඳහා දරන ලද ආදායම ඉක්මවූ වියදම රු.1,204,863ක් නිරවුල් කිරීමෙන් තොරව අඛණ්ඩව උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.1,899,780 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු තුළ වර්ෂය ඉක්ම වූ රු.1,040,665 ක් වටිනා ශේෂ 33ක් හා වර්ෂ 05 ඉක්මවූ රු.111,372 ක් වටිනා ශේෂ 5ක් නියෝජනය විය.

(ආ) එකතු වටිනාකම රු.1,345,222 ක් වූ බාහිර පුහුණු වැඩසටහන් වලින් ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 5 ඉක්මවූ එකතුව රු.493,635 ක ශේෂ නියෝජනය විය.

(ඇ) කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු 2012 ඔක්තෝබර් 28 සිට නොවැම්බර් 04 දක්වා විදේශගත වීම වෙනුවෙන් ආයතනය විසින් දරන ලද රු.160,754 ක මුදලක් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතු කළ අගය මත බදු මුදල් ශේෂය වන රු.34,454,406 ක මුදල ලැබිය යුතු ලෙස ගිණුම් ගතකර තිබුණද එම මුදල ලැබීම පිළිබඳ තහවුරුවක් නොවීය.

### 2.2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත | |
| 47 වගන්තිය | ආයතනය ස්ථාපිත කල දින සිට සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් මූලික වැටුප මත ගණනය කර ගෙවා තිබුණි. |
| (ආ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල | |
| 44 වගන්තිය | ආයතනය ස්ථාපිත කල දින සිට සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් මූලික වැටුප මත ගණනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 757(2) හා 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන වගන්තිය | ශිෂ්‍ය නේවාසිකාගාරයේ 2015 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 880 | ඇප ආඥාපනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය | මුදල් ඇමතිවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.මිලියන 05 ක මුදලක් ආයෝජනය කර තිබුණි. |

**2.2.5 ප්‍රමාණවත් අධිකාරි බලය නොලත් ගනුදෙනු**

2012 ජනවාරි 22 දින සිට 2015 ජනවාරි 03 දින දක්වා අවස්ථා 59 කදී පාලක මණ්ඩල අනුමැතියකින් තොරව රාජකාරි ස්වරූපයේ නොවූ ගමන් සඳහා කි.මී.14644 ක් ආයතනයේ බස් රථය ධාවනයේ යෙදවීම වෙනුවෙන් රු.1,146,038 ක මුදලක් ආයතනයට ලැබිය යුතුව පැවති අතර, එම මුදල අයකර ගැනීමට 2016 අප්‍රේල් 29 දින තෙක් ම කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,156,557 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,786,120 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,942,677 ක වර්ධනයක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,232,437 කින් වැඩිවීම හා ප්‍රවාහන හා නඩත්තු වියදම් රු.2,331,146 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩ ඌනතාවයක්ද 2015 වර්ෂයේ අතිරික්තයක් ද විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේ රු.26,548,041 ක්වූ දායකත්වය 2012 වර්ෂයේදී රු.19,524,394 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.55,241,605 ක්වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිල නිවාස වල අනවසර පදිංචි වීම, සේවය ලබා ගැනීම හා වන්දි ලබා ගැනීම සම්බන්ධව ආයතනයට එරෙහිව අධිකරණයේ නඩු 07 ක් ගොනුකර තිබූ අතර,නඩු දෙකකට අදාළව රු.379,673 ක වන්දි ඉල්ලා තිබුණි.

(ආ) රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් ලැබිය යුතු රු.425,406 ක් වූ හිඟ නිවාස කුලිය හා ඊට අදාළ පොළිය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

(අ) 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- (i) නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමූපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම.
- (ii) සමූපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- (iii) කළමනාකරණ නිපුනතා අවශ්‍ය වන සමූපකාර ව්‍යවසායයන් භාරගෙන කළමනාකරණය කිරීම.
- (iv) සමූපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් ලබා දීම.
- (v) ආදර්ශ සමූපකාර ගම්මාන, ආදර්ශ සමූපකාර වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවීම.

ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- (i) ඉකුත් වර්ෂයේදී බාහිර උපාධි හා වෘත්තීය උපකාරක වැඩසටහන් 11ක් පවත්වා ඇතත්, මෙම වර්ෂයේදී එම පාඨමාලා පවත්වා නොතිබුණි.

- (ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම ඉතා අඩු මට්ටමක විය.

- (iii) මෙම ආයතනයේ ඇති සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් හා ඵලදායීතාවයකින් යොදාගෙන අධ්‍යයන හා පුහුණු කටයුතු ඉටුකිරීම හා ඊට අදාල පහසුකම් සැපයීම ආයතනයේ ප්‍රමුඛතම කාර්යය වුවද, පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය ඉතාඅඩු මට්ටමක පැවතුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී විෂයමාලා 7ක් සඳහා පාඨමාලා 58කට පුහුණු ලාභීන් 1450 ක් බඳවා ගැනීමට ඉලක්ක ගත කර තිබුණද, පාඨමාලා 41ක් සඳහා පුහුණුලාභීන් 992 ක් පමණක් බඳවාගෙන තිබුණු බැවින් ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. එම නිසා ආයතනයේ කෙටි කාලීන පුහුණු පාඨමාලාවලින් හා වෘත්තීය පුහුණු පාඨමාලාවලින් ඉලක්කගත ආදායමට සාපේක්ෂව තත්‍ය ආදායම පිළිවෙලින් මුල් ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.2,243,890 ක අඩුවීමක්ද, සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය අනුව රු.1,116,000 ක අඩුවීමක්ද විය.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව දේශකවරුන්ගේ අපේක්ෂිත දේශනයන් හා ඒ හා සබැඳි අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් පොදු කාල සටහනක් මාසිකව සකස් කර නොතිබුණු අතර,දේශන සඳහා සහභාගී වූ බව සනාථ කෙරෙන පැමිණීමේ ලේඛනවල කාලය හා අත්සන් යොදා දේශන නිසි පරිදි කළ බව සනාථ කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල පුහුණුලාභීන් 463ක් වෙනුවෙන් පැවැත් වූ පාඨමාලා 13ක ප්‍රතිඵල 2016 මැයි 06 වන විටත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල සීමාව තුළ නිකුත් කර ඇති ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේ දී පාඨමාලා 12 ක් වෙනුවෙන් පෙනී සිටි සිසුන්ගෙන් සමත් ප්‍රතිශතය සියයට 9 සිට සියයට 70 දක්වා පරාසයක විය.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

පහත සඳහන්නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.75,445,000 ක ප්‍රතිපාදන මුදලින් රු.20,000,000 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදා ගෙන තිබූ අතර ඉතිරි රු.55,445,000 ක් ප්‍රතිපාදිත ව්‍යාපෘතිවලට යෙදවීමෙන් තොරව ජංගම ගිණුම් තුළ රඳවාගෙන තිබුණි.

(ආ) ආයතනය විසින් රු.238,855 ක මුදලක් ඵලදායි ආයෝජනයකින් තොරව 2007 වර්ෂයේ සිට ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි.

**4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-------------------------------------------

රත්නායක ශාලාව, ඩී හා ජී නේවාසිකාගාර, සභාපතිතුමාගේ කාමරය නවීකරණය පරීක්ෂාව

------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතු වටිනාකමරු.19,414,918 ක්වූ කොන්ත්‍රාත් 4 ක් පිරිනැමීමේ දී ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතියකින් තොරව සීමිත මිල ගණන් කැඳවා ආයතන 2ක මිල ගණන් පමණක් සලකා බලා ආයතනයේ කළමනාකරණ මණ්ඩල තීරණ මත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ එළඹ තිබූ ගිවිසුම්වලට අනුව 2015 නොවැම්බර් 30 දිනට කොන්ත්‍රාත් අවසන් කළ යුතු වුවද, 2016 අප්‍රේල් 29 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී වැඩ නිම කර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති 4ක් සඳහා මුල් ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා රු.14,441,937 ක්වූ නව ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

**4.5 කාර්යය මණ්ඩල පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ මණ්ඩල තීරණ වලට අනුව කථිකාචාර්යවරයෙක් මාසිකව වැඩ කළයුතු අවම පැය ගණන පැය 60ක් විය යුතු වුවත්, කථිකාචාර්යවරු 06 දෙනා විසින් 2015 වර්ෂයේදී පවත්වා තිබුණු මුළු දේශන පැය ගණන 1743කි. ඒ අනුව වර්ෂයේ පැය 2577 ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණි. අභ්‍යන්තර කථිකාචාර්යවරු විසින් පැවැත්විය යුතු දේශන පැය ගණන පැය 2577 කින් ඌන උපයෝජනය වී තිබියදී, බාහිර කථිකාචාර්යවරුන් ගේ සේවය ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.3,483,900ක් බාහිර සම්පත් දායක දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ආ) ස්ථිර ආචාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් රු.4,779,312ක් ද ප්‍රශ්නපත්‍ර සැකසීම, උත්තර පත්‍ර ඇගයීම, නිබන්ධන සැකසීම, පාඨමාලා සම්බනධීකරණ කටයුතු හා කුසලතා ඇගයීමේ ගාස්තු වශයෙන් රු.900,846ක දීමනාවක් ද ගෙවා තිබුණි. ඒ අනුව මාසික වැටුප දේශන පැවැත්වීමට පමණක් සීමා වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 6 කට අදාළව වැය ප්‍රතිපාදනවලින් සියයට 28 සිට සියයට 55 දක්වා ඉතිරිවී තිබූ අතර, වැය විෂයයන් 3ක අයවැය ගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.1,557,974 ක් වැයකර තිබුණි. විදේශීය පාඨමාලා ගාස්තු ආදායම් ලෙස රු.1,260,000ක් ඇස්තමේන්තුගත කර තිබුණද, එම ආදායම් ලබා ගැනීමට අපොහොසත් වී තිබූ අතර, ආදායම් විෂයයන් පහක් සඳහා ඌන ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. තවද ආදායම් විෂයයන් හයක තත්‍ය ආදායම සමග සැසඳීමේදී සියයට 10 සිට සියයට 99 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------------

ඉකුත් වර්ෂයට අදාළ විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් භාණ්ඩ සමීක්ෂණ නියමිත දිනට පැවැත්වීම, ශ්‍රවනාගාරයෙන් ඉවත් කරන ලද පිරිවැය රු.4,107,280 ක් වූ භාණ්ඩ ස්වාධීන තක්සේරුකරුවකුගේ වාර්තාවකින් තොරව අපහරණය කිරීම, ආයතනය සතු වාහන 02 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයට ලබාදීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත දිනට පවත්වා නොතිබීම හා ලේඛන නඩත්තු නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | වියදම් ගිණුම්ගත කිරීම හා ප්‍රතිපාදන වෙන්කිරීම නිවැරදිව සිදු නොකිරීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | දීර්ඝ කාලීනව පැවත එන ශේෂ නිරවුල් නොකිරීම හා ශේෂ සනාථන ලබා නොගැනීම. |
| (ඈ) | වාහන උපයෝජනය | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම, වාහන හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඉ) | මූල්‍ය පාලනය | අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පත්වල මුදල් ආයෝජන කිරීම හා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ජංගම ගිණුම්වල රඳවා තිබීම. |
| (ඊ) | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු නොකිරීම, අභ්‍යන්තර කථිකාචාර්යවරුන් ඌන උපයෝජිතව තිබියදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම. |